# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2088/17 - 2018 සැප්තැම්බර් මස 10 වැනි සඳුදා - 2018.09.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්පත් කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය:* CHI/LND.1/AC/5/71.
4-3/09/2016/ WS/135.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර:*

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුන්නේශ්වරම් පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 568 මුන්නේශ්වරම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මුන්නේශ්වරම ගමේ පිහිටි පුත්තලම මිනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක මූ. පි. පු. 5362 හා 2018.07.20 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටස.

**කැබලි අංක 01**

ඉඩමේ නම: ලුණුපිටියවත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 25 -30ක් පමණ වයසැති පොල් ගස් 42ක්, අවු. 25-30ක් පමණ වයසැති තේක්ක ගස් 09 ක් සහ වැසිකිලියක් ඇත; හිමිකම් කියන්නා කනගසබෙ රාජමනි, කනපති හෝටලය, මුන්නේස්වරම, හලාවත: ප්‍රමාණය: හෙක්ටයාර් 0.2240.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හා ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2018 නොවැම්බර් මස 19 වැනි දින පෙ. ව. 10.00 ට හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 ඔක්තෝබර් මස 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය


ඩී. එම්. ඒ. කේ. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
හලාවත.


2018 සැප්තැම්බර් මස 05 වැනි දින,
හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09– 656